සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017

## Second Term Test - Grade 8 - 2017

නම : ............................................ **කතෝලික ධර්මය** කාලය : පැය 02 යි.

### I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) සකරියස්තුමා අයත් වන්නේ,
(i) බෙන්ජමින් පෙළපතට ය. (ii) ජුදා පූජක පෙළපතට ය.
(iii) මෙල්කිසදෙක් පෙළපතට ය. (iv) දාන් පෙළපතට ය.

(2) a. චිත්‍ර ශිල්පියෙකි.
b. ජුදා ජාතියට අයත් නොවන්නෙකි.
c. ග්‍රීක් භාෂාව මනාව හැසිරවීමට හැකි අයෙකි.
d. සුබාරංචියේ සංකේතය ගවයා ය.

ඉහත ප්‍රකාශ හා සම්බන්ධ වන්නේ,
(i) මතෙව්තුමා ය. (ii) ජොහාන්තුමා ය.
(iii) පාවුළුතුමා ය. (iv) ලූක්තුමා ය.

(3) "මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය වේවා" යන්න ඉදිරිපත් කරන සුවිශේෂකවරයා වන්නේ,
(i) ලූක්තුමා ය. (ii) මතෙව්තුමා ය.
(iii) ජොහාන්තුමා ය. (iv) මකේතුමා ය.

(4) ලුක් සුබාරංචිය සම්පාදනය කළ කාලය වන්නේ,
(i) ක්‍රි.ව 80 - 85 ය. (ii) ක්‍රි.ව 65 - 68 ය.
(iii) ක්‍රි.ව 70 - 75 ය. (iv) ක්‍රි.ව 90 - 100 ය.

(5) සකේවුස්ගේ සිද්ධිය, ශු. ලූක්තුමා ඉදිරිපත් කරන්නේ කුමන සුබාරංචි නාමය යටතේද?
(i) දිළින්දන්ගේ සුබාරංචිය (ii) අන්‍ය ජාතීන්ගේ සුබාරංචිය
(iii) දයාවේ සුබාරංචිය (iv) කොන්වූවන්ගේ සුබාරංචිය

(6) ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරන්නේ,
(i) ජුදයාවෙන් ය. (ii) ජෙරුසලමෙන් ය.
(iii) ගලීලයෙන් ය. (iv) කානා නුවරින් ය.

(7) සුබාරංචිවල ඉතාමත් වැදගත් අංගය වන්නේ,
(i) ජේසු උපත ය. (ii) පාළුකරයේ දින 40ක් ගත කිරීම ය.
(iii) ප්‍රසිද්ධ ජීවිතය ය. (iv) පාස්කු අභිරහස ය.

(8) 'තියෝපිලස්' යන්නෙහි අර්ථය වන්නේ,
(i) දෙවියන් වහන්සේගේ සේවකයා යන්නයි.
(ii) දෙවියන් වහන්සේගේ ශ්‍රාවකයා යන්නයි.
(iii) දෙවියන්වහන්සේගේ මිත්‍රයා යන්නයි.
(iv) දෙවියන් වහන්සේ තෝරාගත් තැනැත්තා යන්නයි.

(9) දාවිත් රජතුමාගේ පරපුරෙන් ලෝක ගැළවුම්කරුවාණන් පැමිණෙන බව ප්‍රකාශ කළේ,
(i) නාතාන් දිවැසිවරයා ය. (ii) මීකා දිවැසිවරයා ය.
(iii) සෙකරියා දිවැසිවරයා ය. (iv) ආමොස් දිවැසිවරයා ය.

(10) ''මිනිස් සමාජය පාපෙන් බේරා ගන්නට මෙහි ආවා...'' යන ගීතිකාවෙහි ඉතිරි පදය වන්නේ,
(i) රජතුන් කට්ටුව බිළිඳු ළග වැටී පඬුරු ඔප්පු කරති.
(ii) දෙව්මව් තුරුලේ උණුසුම ලබමින් මේ ලෝකෙට ආවේ.
(iii) දිවැස්වරුන් බොහෝ කලකට පෙර කී දේ ඉන් ඉටු වුවා.
(iv) ජුසේතුමා කිසිදාකත් නෑ දෙව් අණකට පිටු පැවේ.

**V අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

(හෘද සාක්ෂියට එකඟව, ශුද්ධාත්මයාණන්ගෙන්, දින 50ක් ඒනෝන් තොටුපොළෙන්, දින 40 ක්, සුබාරංචිය, ප්‍රේමයෙන් )

(11) ස්නාවක ජුවාම්තුමා ජනතා මෙහෙවර ආරම්භ කළේ ..............................................ය.

(12) එතුමාණෝ .............................................. ගින්නෙන්ද ඔබ බෞතිස්ම ස්නාපනය කරන සේක.

(13) සත්‍යවාදී බව යනු ............................................................ කටයුතු කිරීමයි.

(14) ජේසුස් වහන්සේ පාළුකරයේදී ........................................... යාච්ඤා කළහ.

(15) දිළිඳුන්හට ........................................... දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක.

**V අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති වගන්ති හරි නම් 3 ලකුණ ද වැරදි නම් 8 ලකුණ ද වරහන් තුළ යොදන්න.**

(16) ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වයට විවෘත වන තරමට අප තුළ නව ජීවනයේ සරු බීජ වර්ධනය වේ. ( )

(17) විවිධාකාර ලෙඩ රෝගවලින් පෙළෙන අය වෙනුවෙන් සුවය පතා යාච්ඤා කිරීම යහපත් ගුණ ධර්මයකි. ( )

(18) ජේසුස් වහන්සේ මහ සිකුරාදා දින දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළ සේක. ( )

(19) ආත්මීක සූදානමේ අවශ්‍යතාවය පිළිබඳව කිතුණුවන් දැනුවත් කරන්නේ ශු. පාවුළුතුමා කොරින්ති ලිපියේ ය. ( )

(20) ශුද්ධාත්ම දීමනා 12 කි. ( )

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

**V පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (i) ජුසේවාස් පියතුමා මෙරට දහම් පණිවිඩය ව්‍යාප්ත කළ ප්‍රදේශ දෙකක් ලියන්න.

(ii) පහත ගීතිකාව සම්පූර්ණ කර දක්වන්න.

විපත් වළේ වැටී පෙළී සිටියවුන් සොයා
........................................................................
දහම් සිසිල පොවා ඔවුන් පවස නිවා
........................................................................

(iii) අභිවෘද්ධි ආලේපය ප්‍රසාද නිධානය ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් දෙකක් ලියන්න.

(iv) ශුද්ධාත්ම ඵල දෙකක් ලියන්න.

(v) දේව රාජය පිළිබඳ දක්වා ඇති නිර්වචන දෙකක් ලියා දක්වන්න.

(vi) දිව්‍ය සත්ප්‍රසාදය ලැබීම සඳහා අප සූදානම් විය යුතු ආකාර දෙක සඳහන් කරන්න.

(vii) ලූක් සුබාරංචි සැකැස්මෙහි ඇති ප්‍රධාන කොටස් දෙකක් ලියා දක්වන්න.

(viii) ජේසුස් වහන්සේ විසින් නාසරෙතයේ ධර්ම ශාලාවේදී කියැවූයේ කාගේ ග්‍රන්ථය ද?

(ix) ශු.ලූක් තුමා පමණක් සඳහන් කරන උපමා දෙකක් ලියන්න.

(x) ස්නාවක ජොහාන්තුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.

( ලකුණු 2 x 10 = 20 )

02. (i) ස්නාවක ජොහාන් තුමාගේ මව්පියන්ගේ නම් ලියන්න.

(ii) ජේසුතුමාගේ පෙරමග සලසන්නා තම අවවාද අනුශාසනා ඉදිරිපත් කළ සමාජ කණ්ඩායම් ත්‍රිත්වය නම් කරන්න.

(iii) වත්මන් සමාජයේ වෙසෙන පහත කණ්ඩායම් වෙත සාධාරණත්වයේ පණිවුඩය ඔබ ගෙන යන ආකාරය බැගින් ලියන්න.

- I දේශපාලන ක්ෂේත්‍රය
- I නීතිඥයන්
- I වෙළඳ ව්‍යාපාරිකයන්
- I ගුරුවරුන්
- I සාමාන්‍ය පුරවැසියන්

(ලකුණු 2 + 3+5 - 10 )

03. (i) ජේසුස් වහන්සේගේ බෞතිස්ම ස්නාපනය ලැබූ අවස්ථාවේදී ඇසුණු හඬ ශු. ලූක් තුමා විස්තර කරන්නේ කෙසේ ද?

(ii) ජේසුතුමා මුහුණ දුන් පරීක්ෂා තුන නම් කරන්න.

(iii) එදිනෙදා ජීවිතයේදී ඔබ පරීක්ෂාවට වැටෙන අවස්ථා පහක් නම් කර ඒවා ජය ගැනීමට වරම් පතා පේළි පහක යැදුමක් ලියන්න. (ලකුණු 2 + 3+5 - 10 )

04. (i) දේව රාජ්‍යයේ වටිනාකම් දැක්වෙන උපමා දෙකක් ලියන්න.

(ii) ශු. ලූක් තුමා පමණක් සඳහන් කරන උපමා තුනක් නම් කරන්න.

(iii) දේව රාජ්‍ය නිරූපණය කරන උපමා තුළින් ඔබේ ජීවිතයට ලැබෙන මඟ පෙන්වීම් පහක් විස්තර කරන්න.

( ලකුණු 2 + 3+5 = 10 )

05. (i) ජේසුතුමා කළ ප්‍රාතිහාර්ය වර්ග හතරෙන් දෙකක් ලියන්න.

(ii) එම ප්‍රාතිහාර්යයන්ට උදාහරණ තුනක් ලියන්න.

(iii) ඔබේ ජීවිතයේ ප්‍රාතිහාර්යයක් අත්දුටු අවස්ථාවක් ලියන්න. ( ලකුණු 2 + 3+5 =10 )

06. (i) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) දිව්‍ය සත්ප්‍රසාද පූර්ව සලකුණු තුනක් ලියන්න.

(iii) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය ලබන්නට සූදානම් වන්නෙකු තුළ ආත්මික සූදානම හා ශාරීරික සන්සන්දනය කරන්න. ( ලකුණු 2 + 3+5 = 10 )

07. (i) අභිවෘද්ධියාලේපය දානය කරන විට රදගුරුතුමා අපේක්ෂකයාගේ නළල ආලේප කරන්නේ කුමන තෛලයෙන් ද? එහිදී භාවිත කරන වචන මොනවා ද?

(ii) ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රියාකාරි වූයේ කෙසේ ද? උදාහරණ තුනක් ලියන්න.

(iii) අභිවෘද්ධි ආලේපය ලැබූ පරිණත කිතුනුවකු ලෙස පහත ස්ථානයන්හි ඔබ කටයුතු කරන්නේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න.

a. ස්වභාවික ව්‍යසනයක දී

b. පාසලේ / දේවස්ථානයේ ශ්‍රමදානයක දී

c. පාසල් ශිෂ්‍යනායක මණ්ඩලයේ දී

d. පාසලේ උදෑසන යාච්ඤා මෙහෙයේ දී

e. ක්‍රීඩා පිට්ටනියේ දී

( ලකුණු 2 + 3+5 = 10 )

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 8 - 2017

### කතෝලික ධර්මය පිළිතුරු පත්‍රය

01. 1. (ii) 6. (iii)
 2. (iv) 7. (iv)
 3. (i) 8. (iii)
 4. (i) 9. (i)
 5. (iv) 10. (iii)

02. 11. ඒනෝන් තොටුපොළෙන් 12. ශුද්ධාත්මයාණන්ගෙන්ද
 13. හෘද සාක්ෂියට එකඟව 14. දින 40 ක්
 15. සුබාරංචිය

03. 16. 4 17. 4 18. 5 19. 4 20. 5

(ලකුණු 2 x 20 = 40)

### II කොටස

01. (i) යාපනය / පුත්තලම / මන්නාරම / හලාවත / මීගමුව / කොළඹ
 (ii) එදා ගියේ ඔබයි පියේ නොබා රැ දිවා
 නවෝදයක් උදා කළේ මහා පිනක් ලබා
 (iii) ප්‍රසාද ස්නාපනය ලබා තිබීම
 වයස අවුරුදු 14ක් සම්පූර්ණ කර තිබීම
 (iv) ප්‍රේමය / ඉවසීම / කරුණාව / නොබිඳෙන දිරිය / ස්නේහය
 (v) දෙවියන් වහන්සේගේ පාලයනට නතුවීම
 පාපය ඉවතලා දේව වරප්‍රසාද තුළ ජීවත් වීම ( පිටු අංක 36 )
 (vi) ශාරීරික සූදානම / ආත්මික සූදානම
 (vii) හැඳින්වීම / ගලීලයේ සේවාව
 ජේසුස් වහන්සේගේ ළමා විය පිළිබඳ කතා
 ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර සඳහා සූදානම
 ගලීලයේ සිට ජෙරුසලම දක්වා ගමන
 (viii) දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථය
 (ix) යහපත් සමරිතානුවරයාගේ උපමාව
 නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව
 ධනපතියා සහ ලාසරස් පිළිබඳ උපමාව
 (x) සරල බව / සත්‍ය වෙනුවෙන් සාක්ෂි දැරීම / බැහැපත්කම / නිහතමානීකම (ලකුණු 2 x 10 = 20)

02. (i) සකරියස් තුමා, එළිසබෙත් තුමිය
 (ii) සාමාන්‍ය ජනතාවට, අයකැමියන්ට, හේවායන්ට
 (iii) දේශපාලන ක්ෂේත්‍රය - වගකීම් නිසි ලෙස ඉටු කරන්න.
 නීතිඥයන් - යුක්තිගරුක වන්න.

වෙළඳ ව්‍යාපාරිකයන්ට - සාධාරණව වෙළඳාමේ යෙදෙන්න.
ගුරුවරුන්ට - ලැබෙන වැටුපට සරිලන සේවයක් ඉටු කරන්න.
සාමාන්‍ය පුරවැසියන්ට - අන් අයට උදව් කරන්න. (ලකුණු 2 + 3+5 - 10 )

03. (i) ''මේ මාගේ පියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි.''
(ii) ගල්ගෙඩියක් පාන් ගෙඩියක් වන්නට අණ කිරීම.
උස්තැනකට පමුණුවා යක්ෂයා ඉදිරියේ නමස්කාර කරන්නැ'යි කීම.
දේව මාළිගාවේ කොත මුදුනේ සිටුවා පහතට පනින්නැ'යි කීම.
(iii) සිසුවා ලියා ඇති යාච්ඤාව බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 + 3+5 - 10 )

04. (i) වපුරන්නා පිළිබද උපමාව
නිධානය, මුතුඇටය, දැල පිළිබඳ උපමා
(ii) යහපත් සමාරියා පිළිබඳ උපමාව
නැතිවුණු පුත්‍රයා පිළිබඳ උපමාව
ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාව
(iii) තම පාපවලට මනස්ථාපනය වී නැවත දෙවියන් වෙත හැරී ඒම.
ජාති ආගම් කුල භේද පසෙක දමා සැමට ප්‍රේම කිරීම.
දුප්පතුන් අමතක නොකිරීම.
අසරණයන්ට පිහිට වීම.
අපට ලැබී ඇති හැකියා හා කුසලතා දියුණු කර ගෙන අන් අයගේ යහපත පිණිස යොමු කිරීම
(ලකුණු 2 + 3+5 - 10 )

05. (i) ස්වභාවධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය
රෝගීන් සුව කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්ය
මළවුන් උත්ථාන කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්ය
දුෂ්ඨාත්ම දුරු කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්ය
(ii) මාරුත දමනය
වතුර මිදිරස බවට පත්කිරීම
කුදු ස්ත්‍රීය සබත් දින සුව කිරීම
(iii) සිසුවා ලියා ඇති කරුණු සැලකිල්ලට ගනිමින් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 + 3 + 5 = 10 )

06. (i) දේව ප්‍රසාද නිධානයකි.
භෝජනයකි.
(ii) මෙල්කිසදෙක්ගේ යාගය
මන්නා භෝජනය
පුප වැඩිකිරීමේ ප්‍රාතිහාර්ය
(iii) පිටු අංක 52,53 බලන්න. (ලකුණු 2 + 3 + 5 =10 )

07. (i) ක්‍රිස්මා තෛලය
ශුද්ධාත්මයාණන්ගේ දීමනාවේ මුද්‍රාව ලබා ගන්න.
(ii) බෞතිස්ම ස්නාපනයේදී
ප්‍රාතිහාර්ය කිරිමේදී
දේශනා කිරීමේදී
(iii) සිසුවා ලියා ඇති කරුණු සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 + 3 + 5 = 10 )